# දුතියො පාඨො

## චන්දො



චන්දො රත්තියං උදෙති. තස්මිං සමයෙ නක්ඛත්තානි විජ්ජන්ති. චන්දො නක්ඛත්තානං රාජා භවති. චන්දකිරණං සීතලං හොති. චන්දකිරණෙන කුමුදානි විකසන්ති. චන්දස්ස කලා අත්ථි. පණ්ණරසියං චන්දො සම්පුණ්ණො විජ්ජොතති. කාලපක්ඛෙ චන්දො හායති. සුක්කපක්ඛෙ සම්පුණ්ණො භවති. තස්ස කලඞ්කම්පි අත්ථි. තං කලඞ්කං සසඞ්කන්ති වදන්ති. තස්මා සසඞ්කොති’පි චන්දස්ස නාමං. චන්දො එකො දෙවො’ති පොරාණිකා චින්තෙසුං. සම්පති විජ්ජාවාදිකා එකො ලොකො’ති වදන්ති. මයම්පි තං මතං සච්චන්ති මඤ්ඤාම.

(පාලි රචනා 1)

### පදමාලාව

| | | | | | |
|---|---|---|---|---|---|
| චන්දො | - | සඳ | රත්තියං | - | රාත්‍රියෙහි |
| උදෙති | - | උදාවෙයි | තස්මිං සමයෙ | - | එසමයෙහි |
| නක්ඛත්තානි | - | තරු | විජ්ජන්ති | - | විද්‍යමාන වෙති |
| රාජා | - | රජ | චන්දකිරණං | - | සඳකිරණ |
| කුමුදානි | - | කුමුදු | විකසන්ති | - | පිපෙති |
| කලා | - | කලා | පණ්ණරසියං | - | පසළොස්වක දින |
| සම්පුණ්ණො | - | පිරුණේ | සුක්කපක්ඛෙ | - | පුරපස |
| විජ්ජොතති | - | බබළයි | කාලපක්ඛෙ | - | අවපස |
| හායති | - | පිරිහෙයි | කලඞ්කං | - | කැළලක් |



නොමිලේ බෙදා හැරීම පිණිසයි

| | | | | | |
|---|---|---|---|---|---|
| **සසබෙකා** | - | සසලකුණ | **තසමා** | - | ඒ නිසා |
| **සමපති** | - | දැන් | **විජ්ජාවාදිකා** | - | විද්‍යාඥයෝ |
| **මඤ්ඤාම** | - | සිතමු | **තං** | - | එය |

## අභ්‍යාස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **කො** | - | කවරෙක් | **කෙන** | - | කුමකින් | **කීදිසො** | - කෙබඳු |
| **කිං** | - | කුමක් ද | **කෙ** | - | කවරහු | | |

1. පහත දැක්වෙන ප්‍රශ්නවලට පාලියෙන් පිළිතුරු සපයන්න.

උදා:- **කො රත්තියං උදෙති? චන්දො රත්තියං උදෙති.**

i. කො නක්ඛත්තානං රාජා භවති ?
ii. කෙන කුමුදානි විකසන්ති ?
iii. පණ්ණරසියං චන්දො කීදිසො භවති ?
iv. කිං චන්දස්ස අපරං නාමං ?
v. චන්දො දෙවො'ති කෙ විනෙන්සුං ?
vi. විජ්ජාවාදිකා චන්දස්ස කිං වදන්ති ?
vii. චන්දකිරණං කීදිසං භවති ?
viii. නක්ඛත්තානි කදා විජ්ජන්ති ?
ix. කිං ත්වං චන්දං ලොකන්ති මඤ්ඤසි, උදාහු දෙවන්ති ?

## පාලි අක්ෂර මාලාව

පාලි අක්ෂර මාලාවේ අක්ෂර 41 ක් (**අක්ඛරාපාදයො එකචත්තාළීසං**) ඇති බවත් එය ස්වර හා ව්‍යඤ්ජන වශයෙන් ප්‍රභේද වන බවත් අපි පළමුවන පාඩමේ දී ඉගෙන ගත්තෙමු. ස්වර උච්චාරණ කාලය අනුව හ්‍රස්ව හා දීර්ඝ වශයෙන් කොටස් දෙකකට බෙදෙන බව ද, 'එ' කාරය හා 'ඔ' කාරය හ්‍රස්ව දීර්ඝ වශයෙන් භාවිත වන ආකාරය ද ඔබ හොඳින් දන්නා කරුණකි. මෙම පාඩමේ දී ව්‍යඤ්ජනාක්ෂර පිළිබඳ ඉගෙන ගනිමු.

## ව්‍යඤ්ජන

ව්‍යඤ්ජන යනු හල් අකුරුයි. ඒවා තනිව උච්චාරණය කළ නො හැකි ය. ස්වර එක්කර ගත් විට ව්‍යඤ්ජන පහසුවෙන් උච්චාරණය කළ හැකි ය. එබැවින් ව්‍යඤ්ජනවලට **නිසිත** යන අපරනාමයක් ද වේ. අර්ථය හා ශබ්දය ව්‍යක්ත කරවන යන අරුත් ඇති බැවින් අක්ෂර මාලාවේ **ක** යන්නේ සිට නිග්ගහීතය අන්ත කොට ඇති 33 ක් අක්ෂර **ව්‍යඤ්ජන** නම් වේ. ව්‍යඤ්ජනාක්ෂරයක් උච්චාරණයට ගතවන කාලය අර්ධ මාත්‍රාවකි.

| | | | | |
|---|---|---|---|---|
| ක | ඛ | ග | ඝ | ඞ |
| ච | ඡ | ජ | ඣ | ඤ |
| ට | ඨ | ඩ | ඪ | ණ |
| ත | ථ | ද | ධ | න |
| ප | ඵ | බ | භ | ම |
| ය | ර | ල | ව | |
| ස | හ | ළ | | |
| (අ)ං | | | | |

යනු එම ව්‍යඤ්ජනාක්ෂර 33 වේ.

## ව්‍යඤ්ජන ප්‍රභේද

පාලි ව්‍යාකරණ ග්‍රන්ථවල විවිධ ව්‍යඤ්ජන ප්‍රභේද දක්නට ලැබේ. මෙහි දී ව්‍යඤ්ජන ප්‍රභේද කිහිපයක් පමණක් ඉගෙන ගනිමු.

**වර්ගාක්ෂර**
**වර්ගාන්තාක්ෂර**
**අවර්ගාක්ෂර**
**නිග්ගහීතය**

## වර්ගාක්ෂර

ව්‍යඤ්ජන අක්ෂර අතර 'ක' යන්නේ සිට 'ම' යන්න දක්වා ඇති අකුරු විසිපහ **වර්ගාක්ෂර** නමින් හැඳින්වේ. එක් වර්ගයකට අක්ෂර පහ බැගින් අයත් වේ. එබඳු වර්ග පහකි. එම වර්ග එකී වර්ගයේ පළමු අකුරෙන් හැඳින්වේ.

| | | | | | |
|---|---|---|---|---|---|
| ක වර්ගය | ක | ඛ | ග | ඝ | ඞ |
| ච වර්ගය | ච | ඡ | ජ | ඣ | ඤ |
| ට වර්ගය | ට | ඨ | ඩ | ඪ | ණ |
| ත වර්ගය | ත | ථ | ද | ධ | න |
| ප වර්ගය | ප | ඵ | බ | භ | ම |

**වග්ගා පඤ්චපඤ්චසො මන්තා.**
**බ්‍යඤ්ජනානං කාදයො මකාරන්තා පඤ්චපඤ්චසො**
**අක්ඛරවන්තො වග්ගා.**
(බාලාවතාර)

**වර්ගාන්තාක්ෂර**

වර්ගයන්ගේ අන්තයේ ඇති අකුරු **වර්ගාන්තාක්ෂරයි.** ඒවා නාසික්‍ය, අනුනාසික්‍ය, නාසිකාක්ෂර, අනුනාසිකාක්ෂර යන නම්වලින් ද හැඳින්වේ.

**ඞ ඤ ණ න ම** යනු ඒ වර්ගාන්තාක්ෂරයි.

**අවර්ගාක්ෂර**

ව්‍යඤ්ජන අක්ෂර අතර වර්ගාක්ෂරවලට ඇතුළත් නොවන සෙසු අකුරු **අවර්ගාක්ෂර** නමින් හැඳින්වේ. **ය ර ල ව** යන අන්තස්ථාක්ෂරත් **ස හ ළ** යන ඌෂ්මාක්ෂරත් **අවර්ගාක්ෂර** යන නමින් හැඳින්වේ.

**නිග්ගහීතය**

"අං **ඉති නිග්ගහීතං**" 'අං' යන මෙහි අකාරයෙන් පරව පිහිටි බින්දුව **නිග්ගහීතය** නම් වේ. නිග්ගහීතය තනිව ශබ්ද කළ නොහැකි නිසා ස්වරයක් ළං කොට ලියනු ලැබෙයි. නිග්ගහීතය වචනවල මැද හා අන්තවල යෙදෙන අතර නිග්ගහීතයකින් වචන ආරම්භ නොවේ. වචනවල මැද යෙදෙන නිග්ගහීතයට වර්ගාන්තාක්ෂර ආදේශවීම සිදු වේ.

නිග්ගහීතය නපුංසක ලිංග ශබ්දවල පඨමා, දුතියා ඒකවචන පදවලත් පුරුෂ ලිංග හා නපුංසක ලිංග ශබ්දවල දුතියා ඒකවචන පදවලත් බහුලව දක්නා ලැබේ. පහත වචන දෙස බලන්න.

**පුප්ඵං** **පුරිසං**
**නයනං** **දෙවං**
**ඵලං** **අජං**
**චක්ඛුං** **ගජං**
**පුඤ්ඤං** **මුනිං**

## අභ්‍යාස

**1. පහත දැක්වෙන ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.**

i. ව්‍යඤ්ජනාක්ෂර ගණනින් කෙතෙක් ද?
ii. වර්ගාක්ෂර දැක්වෙන බාලාවතාරයේ පාඨය ලියා දක්වන්න.
iii. ඔබ දන්නා වෙනත් ව්‍යඤ්ජන ප්‍රභේද දෙකක් ලියන්න.
iv. වර්ගාන්තාක්ෂර ලියා දක්වන්න.
v. ව්‍යඤ්ජනාක්ෂර එනමින් හැඳින්වීමට හේතු දෙකක් ලියන්න.

**2. වර්ගාක්ෂර වගුගත කොට දක්වන්න.**

**3. වර්ගාන්තාක්ෂර යෙදුණු වචන පහ බැගින් ලියා වගුව සම්පූර්ණ කරන්න.**

| ඞ | ඤ | ණ | න | ම |
|---|---|---|---|---|
| සඞකපප | සඤචාරිකං | දණඩං | දනතානි | හුමමා |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

4. පහත දැක්වෙන අක්ෂරවල අක්ෂර ප්‍රභේදය හෝ ප්‍රභේද ලියා දක්වන්න.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| i. | අ | ii. | ඌ | iii. | ප | | |
| iv. | ඣ | v. | ස | vi. | ඞ | | |
| vii. | ල | viii. | ඔ | ix. | එ | x. | ඛ |

5. ඡේදයේ දැක්වෙන නිග්ගහීතය යෙදුණු වචන දහයක් ලියා එම වචනවල තේරුම ලියන්න.

6. පහත දැක්වෙන වාක්‍ය කොටස් සිංහලට නගන්න.

| | | | |
|---|---|---|---|
| i. | බුද්ධස්ස ධම්මො | ii. | භූපාලානං දීපා |
| iii. | ආකාසෙ සුරියො | iv. | රුක්ඛෙසු වානරා |
| v. | වානරානං හත්ථෙහි | vi. | ලොකම්හි රුක්ඛා |
| vii. | බාලස්ස සුනඛො | viii. | ආකාසම්හි චන්දා |
| ix. | භූපාලස්ස අස්සා | x. | රුක්ඛම්හි සාඛා |

7. පහත දැක්වෙන වාක්‍ය කොටස් පාලියට නගන්න.

i. ගමෙ ළමයි
ii. ලෝකයේ දිවයින්
iii. හිරුගේ එළියෙන්
iv. ගොනාගේ පාවලින්
v. සිංහයාගේ ශරීරය
vi. ගසෙහි පක්ෂීහු
vii. අශ්වයන්ගේ පාද
viii. පුරුෂයාගේ ගොන්නු
ix. බුදුන්ගේ ධර්මයෙහි
x. මාර්ගයේ අශ්වයෝ

"අප්පමත්තො හි ඣායන්තො, පප්පොති විපුලං සුඛං"

ධ්‍යාන වඩන නොපමා වූ තැනැත්තා මහත් වූ නිවන් සැපයට පැමිණෙයි.

(ධම්මපදපාළි, අප්පමාදවග්ග, 9 ගාථාව)